# කටුපිටිය ශ්‍රී නාගරුක්ඛාරාම ටැම්පිට රජමහා විහාරයේ පවත්නා වාස්තුවිද්‍යාත්මක පැතිකඩ පිළිබඳ විමර්ශනයක්.

*ඩබ්ලිව්.ඒ.ඩී.ජේ.ජේ.සී. ජයසිංහ[1]*

මහින්දාගමනයෙන් පසු ව මෙරට පැවති සංස්කෘතිය සුවිශේෂීමානයකට නැඹුරු වූයේ බුද්ධාගම නිසා ය. එහි දී බෞද්ධාගමේ ආභාසයෙන් බොහෝ වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් සිදු වූ අතර මහනුවර යුගය වන විට ප්‍රචලිත ඉදිකිරීම් ලෙස ටැම්පිට විහාරයන් හඳුනාගත හැකි ය. ශෛලමය ටැම් මත ඉදිවූ විහාර ටැම්පිට විහාර ලෙස හැඳින්වූ අතර වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය ටැම්පිටි විහාරයන් 28කින් යුක්ත ප්‍රදේශයකි. ඒවායින් සුවිශේෂී විහාරයක් ලෙස කටුපිටිය ශ්‍රී නාගරුක්ඛාරාම ටැම්පිටි විහාරය සඳහන් කළ හැකි ය. නාගරුක්ඛාරාම ටැම්පිට විහාරයේ පවත්නා වාස්තුවිද්‍යාත්මක ලක්ෂණයන් මොනවා ද යන්න අධ්‍යයන කිරීම මෙම පර්යේෂණය සිදු කිරීමේ මූලික ගැටලුව වන අතර මෙම විහාරය සම්බන්ධයෙන් සිදු කළ පර්යේෂණයේ අරමුණ වන්නේ නාගරුක්ඛාරාම ටැම්පිට විහාරයෙන් හමු වන්නා වූ වාස්තුවිද්‍යාත්මක සාධකයන් ලාංකේය ටැම්පිට විහාර සම්ප්‍රදායේ ඉතිහාසය ප්‍රතිනිර්මාණය කිරීමේ දී කොතෙක් දුරට වැදගත් වූවා ද යන්න අධ්‍යයනය කිරීම ය. එසේ ම මෙම පර්යේෂණය සිදු කිරීම උදෙසා ක්ෂේත්‍ර ගවේෂණයන් මෙන් ම ක්ෂේත්‍ර නොවන ගවේෂණයන් භාවිත කරන ලදී. මහනුවර අවදියේ දී සංඝයා වහන්සේලා උදෙසා ඉදිකරන ලද මෙම ටැම්පිට විහාරස්ථානය චෛත්‍යය, බණ මඩුව, දේවාලගෙය, බෝධිය, ආවාසගෙය වැනි තවත් බොහෝ විහාර අංගන්ට මැදිව කටුපිටිය ග්‍රාමයේ පිහිටා තිබේ. වර්තමානයේ පස් පුරවන භූමියේ සිමෙන්තියෙන් නිර්මාණය කරන ලද පාදමක් දැකිය හැකි වූව ද එය ශිලාමය නිර්මාණයක් ලෙස පූර්වයේ දී පවතින්නට ඇත. එම පාදම මත ශෛලමය ආකාරයෙන් ඉදිවුණු ටැම් නමයකින් මෙහි ප්‍රතිමා ගෘහය ඉදිවී තිබේ. ගල්ටැම් මත දිග අතට තබා තිබෙන දැව බාල්ක මත ලී තට්ටුවලින් ඉදි කර තිබෙන ප්‍රතිමා ගෘහය සෙ. මී. 709 ක් හා පළල සෙ. මී. 473 ද, උස සෙ. මී. 173 කින් ද යුක්ත වේ. ප්‍රතිමා ගෘහයට පිවිසෙනුයේ අලංකාර ලී පියගැට පෙළකින් වන අතර පූර්වයේ දී මෙම පියගැට පෙළට සමාන ව අත්වැටක් සකසා තිබීණි. ප්‍රතිමා ගෘහයට පිවිසෙන දොරටුව අසල ඉදි කර තිබෙන දොරටුපාලක මූර්තීන් හා ප්‍රතිමාගෘහය ඇතුළත තිබෙන හිටි බුදුපිළිමය, විෂ්ණු හා දැඩිමුණ්ඩ දෙවියන්ගේ මූර්ති නාගරුක්ඛාරාම ටැම්පිටි විහාරයේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණයන් පෙන්නුම් කරන සාධක වේ. එසේ ම ප්‍රතිමාගෘහයේ අභ්‍යන්තර හා බාහිර බිත්ති තුනී හුණු බදාම තට්ටුවකින් යුක්ත වන අතර ඒ මත ජාතක කථාවන් නිරූපණය වන සිතුවම් ඇඳ තිබෙන්නේ සුදු, කලු, දුඹුරු හා ලා කහ ආදි වර්ණයන් යොදා ගනිමිනි. ඒ අනුව මෙම පර්යේෂණය මඟින් ශ්‍රී නාගරුක්ඛාරාම ටැම්පිටි විහාරය මහනුවර යුගයේ වාස්තුවිද්‍යා අංගයන් රැසකින් යුත් සුවිශේෂී විහාරස්ථානයක් බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** ටැම්පිටි විහාර, ශ්‍රී නාගරුක්ඛාරාම විහාරය, වාස්තුවිද්‍යාව, මූර්ති, සිතුවම්

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. janithjayanath7@gmail.com